2013/04/10

දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,
සහකාර සමෘද්ධි කොමසාරිස්/නියෝජ්‍ය සමෘද්ධි අධ්‍යක්ෂ,
ප්‍රාදේශීය ලේකම්/ නියෝජ්‍ය සමෘද්ධි අධ්‍යක්ෂ,
දිස්ත්‍රික් සමෘද්ධි සම්බන්ධීකරණ නිලධාරී

**2013 මාර්තු, අප්‍රේල් මාසවල සහනාධාර මුදල් ගෙවීම.**

2013 සිංහල අළුත් අවුරුදු හේතුවෙන් මාර්තු හා අප්‍රේල් මාස වලට අදාලව ගෙවිය යුතු සහනාධාර මුදල් (මුදල් කොටස) බැංකු සංගම් අරමුදල් භාවිතයට ගෙන කඩිනමින් ගෙවීමට කටයුතු කරන ලෙසට ඔබ දිස්ත්‍රික්කයේ සියළුම සමෘද්ධි බැංකු සංගම් කළමනාකරුවන්ට උපදෙස් ලබාදීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි. මේ සඳහා අවශ්‍ය මුදල් හා ප්‍රතිපාදන දැනටමත් සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව මගින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත එවා ඇති බව ද සඳහන් කරමි. බැංකු සංගම් වලින් ගෙවන මෙම සහනාධාර මුදල් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලද පසු බැංකු සංගම් වලට ප්‍රතිපූර්ණය කරගත හැකිවනු ඇත.

02. එම කාර්ය 2013 අප්‍රේල් 11,12,13 දිනවලදී සිදු කරන ලෙසත් අමතර කාර්ය මණ්ඩලය අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා ක්ෂේත්‍රයේ සමෘද්ධි සංවර්ධන නිලධාරීන් යොදා ගැනීමට ද මින් අනුමැතිය ලබා දෙමි.

03. ඒ සඳහා පහත සඳහන් ගිණුම් සටහන් තැබීමට කටයුතු කළ යුතුය.

- සහනාධාර ලෙස ප්‍රතිලාභීන්ගේ ගිණුම් වලට බැර කරන මුදලින් ගෙවන කොටස
  (2013 මාර්තු හා අප්‍රේල් මාස වලට අදාලව)

| | | |
|---|---|---|
| අවිනිශ්චිත ගිණුම ණය ගැතියෝ(කේත අංක 3310) | - | හර |
| අදාල තැන්පතු ගිණුම | - | බැර |

- මාර්තු හා අප්‍රේල් මාස වල සහනාධාර මුදල් (මුදලින් ගෙවන කොටස) ලද විට, එම ප්‍රමාණය මේ වන විට පුද්ගල ගිණුම් වලට බැර කර ඇති බැවින් එම වටිනාකම,

| | | |
|---|---|---|
| සමෘද්ධි සහනාධාර අරමුදලින් තැන්පතුකරුවන්ගේ ගිණුම් වලට බැර කළ යුතු අරමුදල් ගිණුම (4038) | - | හර |
| අවිනිශ්චිත ගිණුම ණය ගැතියෝ(කේත අංක 3310) | - | බැර |

04. 2013 මාර්තු අප්‍රේල් සහනාධාර මුදල් 2013 පෙබරවාරි මාසයේ සහනාධාර ලේඛණ පදනම් කරගෙන අදාල සහනාධාරලාභීන්ගේ ගිණුම් වලට බැර කළ යුතු අතර යම් සාධාරණ හේතුවක් මත පමණක් (මිය යැම වැනි) සංශෝධනය කළ හැකි අතර, නව සහනාධාරලාභීන් කිසිදු හේතුවක් මත මෙම ලේඛණයට ඇතුලත් නොකළ යුතුය.

05. සහනාධාර ගෙවීම සඳහා මේ වන විට ජංගම ගිණුමේ හෝ කරන ලද ආයෝජන ඉතිරි තැන්පත් ගිණුමේ මුදල් ප්‍රමාණවත් නොවේනම් ඒ සඳහා බැංකු සංගමය සතු මහ සංගම් ආයෝජන අරමුදල් භාවිතා කිරීමට මින් අවසර ලැබේ.

06 2013 අප්‍රේල් 13 වන සෙනසුරාදා දින ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය හෝ බැංකු කාර්ය මණ්ඩලය මෙම කාර්ය සඳහා අමතර දින සේවයේ යොදවන්නේ නම් ඊට අදාලව දින වැටුප් සියළු නිලධාරීන්ට ගෙවීමට අනුමත කරමි.

07. මෙය අත්‍යවශ්‍ය රාජකාරි කටයුත්තක් ලෙස සලකා කටයුතු කිරීමට අවශ්‍ය උපදෙස් සියළුම අදාල නිලධාරීන්ට ලබාදෙන ලෙස ද වැඩිදුරටත් දන්වා සිටිමි.

ආර්.පී.බී. තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.

<u>පිටපත් :-</u>

| | | | |
|---|---|---|---|
| 01. | ලේකම්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය,<br>5 වන මහල, අංක 464 ඒ, ජායා මාවත,<br>කොළඹ 10 | - | ඔබ විසින් ලබා දී ඇති උපදෙස් අනුව කටයුතු කර ඇත. |
| 02. | සමෘද්ධි කොමසාරිස් ජනරාල්,<br>17, බාන්ස් පෙදෙස , කොළඹ 07. | - | කා.දැ.පි |
| 03. | ප්‍රධාන අභ්‍යන්තර විගණක,<br>ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය | - | කා.දැ.පි. |